012

THE OPEN UNIVERSITY OF SRI LANKA

BACHELOR OF EDUCATION (NATURAL SCIENCE)

DEGREE - LEVEL 5

FINAL EXAMINATION 2006

ESU 3117 – CHILD RIGHTS

DURATION : THREE (03) HOURS

LIBRARY

**DATE : 29.07.2006** **TIME : 9.30 a.m. – 12.30 p.m.**

ANSWER ALL THE QUESTIONS IN PART I AND ANY THREE QUESTIONS FROM PART II.

## PART I

01. Name three important ordinances related to child welfare, enacted during the 1930's and 1940's.

02. List three matters in relation to which courts of law in Sri Lanka are required to make determinations in the best interests of the child.

03. List five home risk factors revealed through research, that threaten survival of the child.

04. Briefly explain what is meant by the concept of "Growth and Development of the Child".

05. List five most prevalent forms of child abuse in Sri Lanka.

06. State briefly the participatory rights of children as set out in Articles 12 and 13 of the convention on Child Rights.

07. State three measures proposed in the convention on Child Rights to ensure implementation of child rights.

08. List four major sources of information on child rights that can be utilized in programmes of awareness raising on child rights in Sri Lanka.

(5x8=40 marks)

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධිය

අවසාන පරීක්ෂණය 2006

ළමා අයිතිවාසිකම් -**ESU 3117**

කාලය - පැය තුනයි.

---

දිනය - 2006.07.29 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30

---

I වන කොටසේ සියළුම ප්‍රශ්නවලටත් II කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

01. එක්දහස් නවසිය තිස් ගණන් හා හතලිස් ගණන්වල දී සම්මත කරගනු ලැබූ, ළමා සුභ සාධනයට අදාල ආඥා පනත් තුනක් නම් කරන්න.

02. ශ්‍රී ලංකා අධිකරණය මගින්, ළමයාගේ උපරිම යහපත සලකා තීරණ ගත යුතු සිද්ධීන් තුනක් දක්වන්න.

03. ළමයාගේ ජීවිතයට තර්ජනයක් වන, පර්යේෂණවලින් අනාවරණය වී ඇති, නිවස හා සම්බන්ධ අවදානම් සාධක පහක් දක්වන්න.

04. "ළමයාගේ වර්ධනය හා සංවර්ධනය" යන සංකල්පයෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය බහුල වශයෙන් ම සිදුවන ස්වරූපයන් පහක් දක්වන්න.

06. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි, 12 හා 13 වගන්තිවල දැක්වෙන ළමා සහභාගිත්ව අයිතිවාසිකම් සැකෙවින් සඳහන් කරන්න.

07. ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙන් යෝජිත ක්‍රියා මාර්ග තුනක් සඳහන් කරන්න.

08. ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා උපයෝගී කරගත හැකි ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රධාන තොරතුරු මූලාශ්‍ර හතරක් දක්වන්න.

(එක් ප්‍රශ්නයකට ලකුණු 05 බැගින්)

## PART II

09. a. State two conditions that state parties recognize in terms of the convention on Child Rights, related to child's right to survival. (4 marks)

b. Discuss the factors that affect the right of the child to survival in relation to,

i. Health and nutritional status of the mother. (8 marks)

ii. Health and nutritional status of the child. (8 marks)

10. Child development entails several aspects of development including personality development.

a. Explain briefly what is 'Personality development' (5 marks)

b. Examine five important functions that a school should perform in order to fulfill a child's need for personality development. (15 marks)

11. a. Describe briefly, 'children placed the difficult circumstances' (5 marks)

b. State major responsibilities of the family in providing care and rehabilitation of children with special needs. (15 marks)

12. a. State three major factors that contribute to child abuse in Sri Lanka. (9 marks)

b. State three legislative measures that are available for the prevention of child abuse in Sri Lanka. (6 marks)

c. Give three reasons as to why we have not been able to prevent child abuse completely in Sri Lanka. (5 marks)

13. a. State three main provisions in the convention on child rights, related to implementation of child rights. (6 marks)

b. Describe briefly five major initiatives Sri Lanka has taken for ensuring the implementation of the various measures related to child rights. (14 marks)

14. Write short notes on any three of the following.

a. Fundamental principles governing child rights.

b. Participatory rights of children in the context of school.

c. Social development of children

d. Role of teachers as recipients and purveyors of information on child rights.

e. Child Protection Authority – Sri Lanka.

(20 marks)

*- Copyrights reserved -*

## II කොටස

09. i. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව, ළමයාගේ ජීවත්වීමට ඇති අයිතිය පිළිබඳව පාර්ශ්වකාර රාජ්‍ය පිළිගත යුතු කොන්දේසි දෙක දක්වන්න.
(ලකුණු 04)

ii. ළමයාගේ ජීවත්වීමට ඇති අයිතිය කෙරෙහි බලපාන, පහත සඳහන් කරුණු හා සම්බන්ධ සාධක සාකච්ඡා කරන්න.

(අ) මවගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය (ලකුණු 08)
(ආ) ළමයාගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය (ලකුණු 08)

10. ළමා වර්ධනය, පෞරුෂ වර්ධනය ඇතුළු අංශ කීපයකින් සමන්විත වේ.

i. "පෞරුෂ වර්ධනය" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 05)

ii. ළමයාගේ පෞරුෂ වර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා පාසල විසින් ඉටු කළයුතු, වැදගත් කාර්යයන් පහක් විමසන්න.
(ලකුණු 15)

11. i. "විශේෂ අවස්ථාවන්හි පසුවන ළමුන්", කවරහුදැයි කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 05)

ii. විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ගේ සුරැකීම හා පුනරුත්ථාපනය අරබයා පවුල වෙත පැවරෙන ප්‍රධාන වගකීම් සඳහන් කරන්න.
(ලකුණු 15)

12. i. ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුනක් සඳහන් කරන්න.
(ලකුණු 09)

ii. ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය වැලැක්වීම අරමුණු කරගත් ව්‍යවස්ථාමය පියවර තුනක් දක්වන්න.
(ලකුණු 06)

iii. ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය සහමුලින්ම නැති කිරීම දුෂ්කර වීම කෙරෙහි බලපා ඇති හේතු තුනක් සපයන්න.
(ලකුණු 05)

13. i. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ අඩංගු ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රධාන ප්‍රතිපාදන තුනක් දක්වන්න.
(ලකුණු 06)

ii. ළමා අයිතිවාසිකම් පිළිබඳ විවිධ ක්‍රියාමාර්ග, ක්‍රියාත්මක කිරීම තහවුරු කරනු පිණිස, ශ්‍රී ලංකාව විසින් ගනු ලැබ ඇති ප්‍රධාන පියවර පහක් කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 14)

14. මින් <u>තුනක්</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ළමා අයිතිවාසිකම් සඳහා පාදක වන ප්‍රධාන මූලධර්ම.
ii. පාසල් සන්දර්භය තුළ, ළමුන්ගේ සහභාගිත්ව අයිතිවාසිකම්.
iii. ළමුන්ගේ සමාජයීය සංවර්ධනය.
iv. ගුරුභවතුන්, ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුම ලබන්නන් හා දැනුම සපයන්නන් වශයෙන්.
v. ශ්‍රී ලංකාවේ ළමා සුරක්ෂණ අධිකාරිය.

( ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි. -

LIBRARY